# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2480/26 - 2026 මාර්තු මස 20 වැනි සිකුරාදා - 2026.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(XV)(ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන සහ 139 වන වගන්තීන් සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය, හරිනි අමරසූරිය වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින් 2006 නොවැම්බර් මස 03 වැනි දින අංක 1469/38 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද (කලින් කලට සංශෝධිත පරිදි වූ) නියමයේ උපලේඛනය, (2017 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 2037/18 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති පරිදි) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන “ඉංජිනේරු පීඨය” යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන “10. පේෂකර්ම තාක්ෂණ අධ්‍යයන අංශය” යන අයිතමය වෙනුවට පහත දැක්වෙන සටහන ආදේශ කිරීම මගින්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

“10. පේෂකර්ම සහ ඇඟලුම් ඉංජිනේරු අධ්‍යයන අංශය”

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2026 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 - 0184

1A - PG 7575 - 328 (2026/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*